TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපළ සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර, කොළඹ 05.
2019.10.19.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි ,

<u>එක් දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීම සදහා පහසුකම්, ප්‍රදාන ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.</u>

හින්දු ආගමික උත්සවයක් වන දීපාවලි උත්සවය වෙනුවෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු මුදල්වලින් වතු සමාගම්වලට පොලී රහිතව නැවත මුදල් අය කරගැනීමේ පදනම මත එක වතු කම්කරුවෙකුට රජය මගින් රුපියල් 5000.00/=ක අත්තිකාරම් මුදලක් මුදා හැරීම සදහා කැබිනට් පත්‍රිකාවක් වැවිලි කර්මාන්ත අමාත්‍ය නවීන් දිසානායක මහතා විසින් ඉදිරිපත් කල බව අමාත්‍ය පලනි දිගම්බරම් මහතා කියා සිටි බව 2019 ඔක්තෝම්බර් 17වන දින මව්බිම, අරුණ , රස යන පුවත්පත්වල වාර්තා කර ඇත.

මෙසේ මුදල් ප්‍රදානය කිරීම මගින් එක් විශේෂ දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වීමේ හැකියාව ඇති අතර 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 4(iii) යටතේ විග්‍රහ කර ඇත.එමනිසා මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බලා අවශ්‍යය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංඛී අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතාගේ 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (T.SL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි.පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේදී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තූතියි .

මෙයට,

විශ්වාසී.

Lakvijaya Bandara
..............................

ලක්විජය බණ්ඩාර .
ජාතික සම්බන්ධීකාරක.(PPPR)